සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

81 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2017**

| | | |
|---|---|---|
| කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය | I, II | පැය තුනයි |
| விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் | I, II | மூன்று மணித்தியாலம் |
| Agriculture and Food Technology | I, II | Three hours |

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ශ්‍රී ලංකාවේ පළමුවෙන් ම ආරම්භ කරන ලද බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය වනුයේ,
(1) මහවැලි යෝජනා ක්‍රමයයි. (2) නිල්වලා යෝජනා ක්‍රමයයි.
(3) ගල්ඔය යෝජනා ක්‍රමයයි. (4) මොරගහකන්ද යෝජනා ක්‍රමයයි.

**2.** වැවක බැම්මට රළ පහරින් සිදු විය හැකි හානි වැළැක්වීම සඳහා ඉදිකර ඇති අංගය නම්,
(1) බිසෝ කොටුව ය. (2) සොරොව්ව ය. (3) සළපනාව ය. (4) පිටවාන ය.

**3.** තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානයෙන් ලබා ගත් පාඨාංක ඇසුරෙන් නිර්ණය කළ හැකි කාලගුණික පරාමිතිය වනුයේ,
(1) වායුගෝලීය උෂ්ණත්වයයි. (2) ආලෝක තීව්‍රතාවයි.
(3) වර්ෂාපතනයයි. (4) සාපේක්ෂ ආර්ද්‍රතාවයි.

**4.** ශරීරයට ප්‍රෝටීන් ලබා දීම සඳහා නිර්මාංශ ආහාර වේලක ඇතුළත් කළ යුතු ආහාර ද්‍රව්‍යයක් නම්,
(1) අර්තාපල් ය. (2) කව්පි ය. (3) කැරට් ය. (4) බත් ය.

**5.** නිරිතදිග මෝසම් වර්ෂාව මගින් ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය ලැබෙන දිස්ත්‍රික්ක වනුයේ,
(1) කොළඹ, ගාල්ල හා කළුතර ය. (2) අනුරාධපුර, මහනුවර හා ත්‍රිකුණාමලය ය.
(3) අනුරාධපුර, යාපනය හා මුලතිව් ය. (4) මන්නාරම, වව්නියාව හා කොළඹ ය.

**6.** පාංශු භෞතික ලක්ෂණ වනුයේ,
(1) පාංශු වයනය හා පාංශු ලවණතාව ය. (2) පාංශු ආම්ලිකතාව හා ක්ෂාරීයතාව ය.
(3) කැටායන හුවමාරු ධාරිතාව හා පාංශු වයනය ය. (4) පාංශු වයනය හා පාංශු ව්‍යුහය ය.

**7.** පොළොන්නරුව, අනුරාධපුරය හා වව්නියාව යන දිස්ත්‍රික්කවල බහුලව ව්‍යාප්තව තිබෙන මහා පස් කාණ්ඩය නම්,
(1) රතු කහ පොඩ්සොලික් පස ය. (2) රතු දුඹුරු ලැටසොලික් පස ය.
(3) චූර්ණමය නොවන දුඹුරු පස ය. (4) රතු දුඹුරු පස ය.

**8.** පහත දැක්වෙන සාධක සලකන්න.

A - උච්චත්වය
B - ප්‍රදේශයේ ඇති පස් කාණ්ඩය
C - සමකයේ සිට ඇති දුර
D - ප්‍රදේශයේ පවතින ශාක ගහනය

එම සාධක අතරින් යම් ප්‍රදේශයක වායුගෝලීය උෂ්ණත්වය කෙරෙහි බලපානුයේ,
(1) A, B හා C පමණි. (2) A, C හා D පමණි.
(3) B, C හා D පමණි. (4) A, B, C හා D යන සියල්ලම ය.

**9.** 'මූලික බිම් සැකසීම' හා 'අතුරුයත් ගැම' යන බිම් සැකසීමේ ක්‍රියාවලි දෙකට ම භාවිත කළ හැකි උපකරණ වනුයේ,
(1) රොටවේටරය හා තැටි නගුල ය. (2) තැටි පෝරුව හා උදැල්ල ය.
(3) උදැල්ල හා උදලු මුල්ලුව ය. (4) අත් මුල්ලුව හා අත් ඉස්කෝප්පය ය.

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**10.** පහත A, B හා C වලින් දැක්වෙන බීජ වර්ග ඒවායේ විශාලත්වය අඩු වන අනුපිළිවෙළට සකසා ඇති වරණය කුමක්ද?
A - තම්පලා B - වම්බටු C - බණ්ඩක්කා
(1) A, B, C (2) B, A, C (3) B, C, A (4) C, B, A

**11.** කුකර්බිටේසියේ කුලයට අයත් ශාක වනුයේ,
(1) කව්පි, මුං හා බෝංචි ය. (2) බඩ ඉරිඟු, කුරක්කන් හා වී ය.
(3) වට්ටක්කා, පතෝල හා කරවිල ය. (4) වම්බටු, මිරිස් හා තක්කාලි ය.

**12.** අධෝභෞම ආකාරයට ප්‍රරෝහණය වන මාෂ බෝගය වනුයේ,
(1) කඩල ය. (2) මුං ය. (3) බෝංචි ය. (4) කව්පි ය.

**13.** ඉඟුරු සහ කහ වගා කිරීමේ දී රෝපණ ද්‍රව්‍ය ලෙස භාවිත කෙරෙනුයේ,
(1) බල්බ ය. (2) බල්බිල ය.
(3) ස්කන්ධ ආකන්ද ය. (4) රෛසෝම ය.

**14.** උස් තවාන් පාත්තියක සම්මත පළල සෙ. මී.
(1) 80 කි. (2) 100 කි. (3) 120 කි. (4) 140 කි.


**15.** පාංශු දේහයෙන් පස් අංශු වෙන් වීම, ප්‍රවාහනය හා වෙනත් ස්ථානයක තැන්පත් වීම හඳුන්වනු ලබනුයේ,
(1) පාංශු ව්‍යුහය වශයෙනි. (2) පාංශු ජනනය වශයෙනි.
(3) පාංශු ඛාදනය වශයෙනි. (4) පාෂාණ ජීර්ණය වශයෙනි.

**16.** ආම්ලික වූ පසක් උදාසීන කිරීම සඳහා එම පසට යෙදිය යුතු ද්‍රව්‍ය වනුයේ,
(1) කුඩු කරන ලද හුණු ගල් ය. (2) කාබනික ද්‍රව්‍ය ය.
(3) එප්පාවල ඇපටයිට් ය. (4) ගොම පොහොර ය.

**17.** ශාක වර්ධනය සඳහා අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක දෙකක් වනුයේ,
(1) Zn හා Mn ය. (2) C හා N ය. (3) Mg හා K ය. (4) Ca හා S ය.

**18.** ශාක පත්‍ර විචිත්‍ර වීම, පත්‍රවල හරිතවර්ණය අඩු වීම, පත්‍ර නාරටි බේරීම සහ ශාක කුරු වීම දක්නට ලැබෙනුයේ,
(1) දිලීර ආසාදනවල දී ය. (2) බැක්ටීරියා ආසාදනවල දී ය.
(3) වයිරස් ආසාදනවල දී ය. (4) වටපණු ආසාදනවල දී ය.

**19.** පහත රූපසටහනෙහි දැක්වෙන්නේ කෘමි පළිබෝධ පාලනයේ දී යොදාගනු ලබන ඇටවුමකි. මෙය මගින් පාලනය කරනු ලබන පළිබෝධය වනුයේ,
(1) කුඩිත්තා ය.
(2) පලතුරු මැස්සා ය.
(3) අවුලකපෝරා ය.
(4) එපිලැක්නා ය.



**20.** ඇතැම් ශාකවල පුෂ්පීකරණයට දිවා කාලයේ දිග බලපායි. මෙම සංසිද්ධිය හඳුන්වනු ලබනුයේ,
(1) ප්‍රභාසංස්ලේෂණය ලෙස ය. (2) ප්‍රභා අවධි සංවේදීතාව ලෙස ය.
(3) වසන්තීකරණය ලෙස ය. (4) උත්ස්වේදනය ලෙස ය.

**21.** පහත දැක්වෙන පැළෑටි අතරින් ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටියක් වනුයේ,
(1) කුප්පමේනිය ය. (2) කළාදුරු ය. (3) විඩේලියා ය. (4) ඇත්තඩි ය.

**22.** බෝග වගාවේ දී පිදුරු, වියළි කොළ රොඩු, දහයියා, කොහුබත් ආදිය වසුන් ලෙස යොදා වල් පැළ පාලනය කරනු ලැබේ. මෙහිදී වල් පැළ පාලනය වනුයේ වල් පැළ වර්ධනයට අවශ්‍ය,
(1) වාතාශ්‍රය නොලැබීම නිසා ය. (2) ජලය නොලැබීම නිසා ය.
(3) ආලෝකය නොලැබීම නිසා ය. (4) පෝෂණය නොලැබීම නිසා ය.

**23.** වේගවත් සුළං සහිත බෑවුම් භූමියක බෝග වගා කිරීමේ දී යෙදීමට සුදුසු ජල සම්පාදන ක්‍රමය වනුයේ,
(1) පිටාර ජල සම්පාදනයයි. (2) බේසම් ජල සම්පාදනයයි.
(3) ඉසින ජල සම්පාදනයයි. (4) බිංදු ජල සම්පාදනයයි.

**24.** පහත සඳහන් ද්‍රව්‍ය අතරින් වඩාත් පරිසර හිතකාමී ආහාර ඇසුරුම් ද්‍රව්‍යයක් වනුයේ,
(1) පොලිතින් ය. (2) පොලි ප්‍රොපලින් ය.
(3) කාඩ්බෝඩ් ය. (4) ලැමිනේට් කළ ඇලුමිනියම් පටල ය.

[ තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**25.** බෝග වගාවේ දී බහුලව භාවිත කරනු ලබන, ජලයේ හොඳින් දියවන, ගඩොල් රතු පැහැති, ස්ඵටිකරූපී රසායනික පොහොර වර්ගය වනුයේ,
(1) යූරියා ය. (2) එප්පාවල ඇපටයිට් ය.
(3) මියුරියේට් ඔෆ් පොටෑෂ් ය. (4) ඇමෝනියම් සල්ෆේට් ය.

**26.** ඩැපොග් තවාණකින් ලබා ගන්නා වී පැළ ක්ෂේත්‍රයෙහි සිටුවිය යුත්තේ ඒවායේ වයස දින,
(1) 5 - 7 කිනි. (2) 10 - 14 කිනි. (3) 21 - 24 කිනි. (4) 30 - 35 කිනි.

**27.** බෝගවල වර්ධනය අඩු වී ශාක කුරු වීමට සහ මේරූ පත්‍ර කහ පැහැ වීමට හේතු වනුයේ කුමන ශාක පෝෂක ඌනතාව ද?
(1) නයිට්‍රජන් (2) පොස්පරස් (3) පොටෑසියම් (4) කැල්සියම්

**28.** ශාකමය හා සත්ත්වමය ද්‍රව්‍ය කොම්පෝස්ට් බවට පත් වීම සඳහා වඩාත් සුදුසු වනුයේ,
(1) වියළි සහ ආම්ලික තත්ත්වයකි. (2) වාතනය සහ තෙතමනය සහිත උදාසීන තත්ත්වයකි.
(3) වාතනය සහිත ආම්ලික තත්ත්වයකි. (4) වියළි සහ උදාසීන තත්ත්වයකි.

**29.** බෝග වගා කිරීමේ දී එක් එක් බෝගය සඳහා නිර්දේශිත පරතරයක් පවත්වා ගැනීමට හේතුව නම්,
(1) ආලෝකය, ජලය සහ පෝෂක සඳහා තරගකාරිත්වයක් ඇති වීම වැළැක්වීමයි.
(2) පසේ කැටායන හුවමාරු ධාරිතාව වැඩි කිරීමයි.
(3) පශ්චාද් සාත්තු කිරීම පහසු කිරීමයි.
(4) ශාකවල උත්ස්වේදනය අඩු කිරීමයි.

**30.** ආහාර මාධ්‍යයේ පවතින pH අගය වෙනස් කිරීමෙන් පරිරක්ෂණය කර ඇති ආහාර වර්ගයකි,
(1) මුදවාපු කිරි. (2) අච්චාරු. (3) ලුණු දෙහි. (4) පලතුරු ජෑම්.

**31.** නිසරු පසක වගා කර ඇති අර්තාපල් වගාවක පත්‍ර දාර කහ පැහැ වී පසුව එම දාර පිළිස්සුණු ස්වභාවයක් පෙන්නුම් කළේ ය. මෙයට හේතුව විය හැක්කේ,
(1) නයිට්‍රජන් ඌනතාවයි. (2) පොස්පරස් ඌනතාවයි.
(3) පොටෑසියම් ඌනතාවයි. (4) මැග්නීසියම් ඌනතාවයි.

**32.** ශාකයකට ඉක්මනින් පොස්පරස් සැපයීම සඳහා යෙදිය යුතු පොහොර වර්ගයකි,
(1) රොක් පොස්පේට්. (2) එප්පාවල ඇපටයිට්.
(3) ත්‍රිත්ව සුපර් පොස්පේට්. (4) කොම්පෝස්ට්.

**33.** නිර්පාංශු වගාවේ දී යොදා ගනු ලබන සිරස් වගා මලු පිරවීම සඳහා වඩාත් සුදුසු රෝපණ මාධ්‍යය වනුයේ,
(1) කොහුබත් ය. (2) කොහු කෙඳි ය. (3) සියුම් වැලි ය. (4) පර්ලයිට් ය.

**34.** භෞතික භූමි භාවිත වර්ගීකරණයට අනුව අංක 1 ලෙස වර්ග කරනු ලබන භූමියක වගා කිරීමට නිර්දේශ කරනුයේ,
(1) වී ය. (2) වැවිලි බෝග ය. (3) වනාන්තර ය. (4) තෘණ ය.

**35.** ශ්‍රී ලංකාවේ ඇති කළ හැකි ඉන්දීය කිරිගව වර්ගයකි,
(1) කිලාරි. (2) ජර්සි. (3) අයර්ෂයර්. (4) සින්දි.

**36.** ගව දෙනුන්ගේ වියළි කාලය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - වියළි කාලය යනු දෙනකගේ ප්‍රසූතියට පෙර කිරි දොවා නොගන්නා කාලයයි.
B - ගව දෙනකගේ සම්මත වියළි කාලය දින 60කි.
C - ගව දෙනකට වියළි කාලයක් ලබා දීමෙන් කුස තුළ සිටින පැටවාගේ වර්ධනය හොඳින් සිදු වේ.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ලම ය.

**37.** ප්‍රෝටසෝවා හේතුවෙන් කුකුළන්ට වැළඳෙන රෝගයකි,
(1) පුල්ලෝරම්. (2) කොක්සිඩියෝසිස්. (3) ගම්බෝරෝ. (4) රැනිකට්.

**38.** ගොවිපොළ සතුන්ට ලබා දිය හැකි දළ ආහාරයකි,
(1) බඩ ඉරිඟු බීජ. (2) පොල් පුන්නක්කු. (3) හේ (වියළි තෘණ). (4) හාල් නිවුඩු.

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**39.** පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) අධිශීතන තත්ත්ව යටතේ මස් ගබඩා කර තැබිය යුතු උෂ්ණත්වය –18 °C වේ.
(2) ජීවාණුහරිත කිරි නිපදවනුයේ නැවුම් කිරි විසිරි වියළීමෙනි.
(3) පැස්ටරීකෘත කිරි නිපදවීම පිණිස ක්ෂුද්‍රජීවීන් යොදා ගැනේ.
(4) යෝගට් නිපදවීමේ දී කිරි පැසවීමට දිලීර යොදා ගැනේ.

**40.** මුල් කිරි හෙවත් කොලෙස්ට්‍රම් පිළිබඳ ව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වෙයි.
A - මුල් කිරිවල විරේචක ගුණය ඇත.
B - මුල් කිරි බීමට දීමෙන් වසු පැටවුන්ගේ ප්‍රතිශක්තිය වැඩි වේ.
C - මුල් කිරි පැටවුන්ට බීමට නුසුදුසු නිසා දොවා ඉවත් කළ යුතු ය.
මේවා අතරින් සත්‍ය ප්‍රකාශ නම්,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ලම ය.

* *

[ පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

81 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය I, II
விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் I, II
Agriculture and Food Technology I, II

**කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය II**

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

**1.** කෘෂිකර්මයේ දී අපේක්ෂා කරනුයේ බෝග වගාවෙන් හා සත්ත්ව පාලනයෙන් උපරිම නිෂ්පාදනයක් ලබා ගැනීම ය. මේ සඳහා බෝග වගාව හා සත්ත්ව පාලනය ආරම්භයේ සිට නිෂ්පාදන වෙළෙඳපොළට සැපයීම දක්වා මනා කළමනාකාරිත්වයක් අවශ්‍ය වේ.

(i) බෝග වගාවේ දී සිදු කරනු ලබන මූලික බිම් සකස් කිරීමට අයත් ක්‍රියා **දෙකක්** සඳහන් කරන්න.

(ii) අතුරුයත් ගෑමේ අරමුණු **දෙකක්** ලියන්න.

(iii) බෝග වගාවේ දී බීජ තවාන් කර ලබා ගන්නා පැළ සිටුවීමෙන් ලැබෙන වාසි **දෙකක්** ලියන්න.

(iv) තවාන් පස ජීවාණුහරණය කර ගන්නා ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(v) ෆැබේසියේ කුලයට අයත් එළවළු බෝග **දෙකක්** සහ කුකර්බිටේසියේ කුලයට අයත් එළවළු බෝග **දෙකක්** සඳහා වෙන් වෙන් ව නිදසුන් දෙන්න.

(vi) බීජ සුප්තතාවට බලපාන හේතු **දෙකක්** ලියන්න.

(vii) බෝග වගාවේ දී යොදා ගන්නා භූතල ජල සම්පාදන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(viii) ආහාර පිණිස ගනු ලබන භූගත කඳන් වර්ග **දෙකක්** නම් කර එම එක් එක් භූගත කඳන් වර්ගය සහිත බෝගය සඳහා නිදසුන බැගින් දෙන්න.

(ix) රැක්කවීම සඳහා සුදුසු බිත්තරවල තිබිය යුතු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(x) පලතුරු පරිරක්ෂණය කළ හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

**2.** ජලය බෝග වගාව සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන අතර මනාව ජල කළමනාකරණය කිරීම ඉතා වැදගත් වේ.

(i) බෝග වගාව සඳහා ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු **තුනක්** සඳහන් කරන්න.

(ii) (a) පාංශු ජලය පසෙන් ඉවත් වන ක්‍රම **තුනක්** සඳහන් කරන්න.

(b) පාංශු ජලය සංරක්ෂණය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න.

(iii) වගා බිම්වල දුර්වල ජලවහනය නිසා ඇති වන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

**3.** බෝග වගාවේ දී ශාකවලට මනාව පෝෂණය සැපයීම පිණිස රසායනික පොහොර හා කාබනික පොහොර යොදනු ලැබේ.

(i) බෝගවල වර්ධනය සඳහා අත්‍යවශ්‍ය මහා පෝෂක **හතරක්** සඳහන් කරන්න.

(ii) බෝගවලට යොදන රසායනික පොහොරවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** ලියන්න.

(iii) බෝග වගාවකට රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර යෙදීමේ වාසි **තුනක්** ලියන්න.

[හයවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**4.** බෝග සංස්ථාපනයේ දී බීජ මගින් නිපදවා ගන්නා ලද පැළ හා වර්ධක ප්‍රචාරණ ක්‍රම මගින් නිපදවා ගන්නා පැළ යොදා ගැනේ.

(i) වර්ධක ප්‍රචාරණයේ වාසි **තුනක්** සඳහන් කරන්න.

(ii) ඇතැම් බීජ සිටුවීමට පෙර බීජ ප්‍රතිකාරවලට ලක් කරනු ලැබේ. පහත දැක්වෙන බීජ ප්‍රතිකාර සඳහා හේතු පැහැදිලි කරන්න.

(a) තක්කාලි බීජ වටා ඇති ලිස්සනසුලු ද්‍රව්‍ය සෝදා ඉවත් කිරීම

(b) කුරක්කන් බීජ වැලි සමග මිශ්‍ර කිරීම

(c) සෝයා බෝංචි බීජවලට 'නයිට්‍රජන් එස්' බැක්ටීරියාව ආමුකුලනය කිරීම

(iii) වායව අතු බැඳීමේ ක්‍රමයට අත්තක් මුල් අද්දවා ගන්නා ආකාරය නම් කරන ලද රූපසටහනක් සහිතව විස්තර කරන්න.

**5.** බෝග වගාවේ දී පාංශු ජලය හා පාංශු වාතය බෝගවලට උචිත පරිදි පැවතීම වැදගත් වේ.

(i) පාංශු ජලය පසේ පවතින ආකාර **තුන** නම් කරන්න.

(ii) පහත දැක්වෙන පාංශු තෙතමන මට්ටම්වල දී පසෙහි පවතින පාංශු ජල ආකාර මොනවා ද?

(a) සංතෘප්ත අවස්ථාවේ දී

(b) ක්ෂේත්‍ර ධාරිතාවේ දී

(c) ස්ථිර මැලවීමේ අවස්ථාවේ දී

(iii) (a) බෝග වගාවේ දී පාංශු වාතයේ වැදගත්කම් **දෙකක්** ලියන්න.

(b) පසේ වාතනය දියුණු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

**6.** බෝග වගාවේ දී අස්වනුවල ප්‍රමාණය හා ගුණාත්මය අඩු වීමට එක් හේතුවක් ලෙස කෘමි පළිබෝධ හානි හැඳින්විය හැකි ය.

(i) (a) බෝගවලට පහත දැක්වෙන ඍජු හානි සිදු කරන කෘමීන් සඳහා උදාහරණ **දෙක** බැගින් දෙන්න.

(A) පටක විකා කෑම

(B) පටක විද යුෂ උරා බීම

(b) පටක විද යුෂ උරා බොන කෘමීන් නිසා බෝගවලට සිදු වන වක්‍ර හානියක් ලියන්න.

(ii) කෘමි පළිබෝධ පාලනයේ දී යොදාගත හැකි රසායනික නොවන ක්‍රම **හතරක්** ලියන්න.

(iii) රසායනික පළිබෝධ නාශක භාවිතයේ දී අනුගමනය කළ යුතු ආරක්ෂක පිළිවෙත් **තුනක්** ලියන්න.

**7.** ගව පාලනයේ දී පිරිසිදු කිරි නිෂ්පාදනය කිරීම ඉතා වැදගත් වේ.

(i) පිරිසිදුව කිරි නිෂ්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත් **හතරක්** ලියන්න.

(ii) (a) ගව දෙනකගේ මද ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(b) ගව පැටවකු ඉපදී මුල් දිනය තුළ පැටවාට කළ යුතු සත්කාර **දෙකක්** ලියන්න.

(iii) ගව දෙනුන්ට වැළඳෙන මැස්ටයිටිස් (බුරුළු ප්‍රදාහය) රෝගයේ

(a) රෝග කාරකයා

(b) රෝග ලක්ෂණ

(c) වළක්වා ගන්නා ක්‍රම

ලියන්න.

* * *

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/